**බළන්ගොඩ නගර සභාව**

**2025.10.14 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව**

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2025.10.14**

**වේලාව -පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු උප සභාපති | පේෂල නිකලන්ද මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම් රූමි මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.නිමල් කරුණාරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රීනී | පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එන්.ඒ.එස් චන්දන මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එස්.යූ.සී. ජයනක මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රී | එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා |
| 15. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |
| 2. ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරිනි | ජී.ඩී.ඒ සේමපාල මිය |

**01. පසුගිය මහා සභාවේ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු උපසභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව අද දින සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.අනතුරුව ගරු සභාපතිතුමා රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ සමුළුව සඳහා සහභාගී වූ බැවින් අදදින සභාවට සහභාගී නොවන බවත් සභාව පැවැත්වීම සඳහා උප සභාපති ලෙස තමාට පැවරූ බවත් එතුමා වැඩිදුරටත් සඳහන් කලේය.

ඉන් අනතුරුව ගරු උප සභාපතිතුමා, 2025-09-09 දිනැති මහා සභා වාර්තාව සහ 2025-09-23 සහ 2025-10-03 යන දිනැති විශේෂ මහ සභා වාර්තා සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තා බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් 2025-09-09 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

2025-10-03 දිනැති විශේෂ සභා වාර්තාව සම්බන්ධයෙන් විමසීම් කරමින් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පවසා සිටියේ එහි සඳහන් බලන්ගොඩ මහජන බස් නැවතුම්පළ පරිශ්‍රයේ ඇති පොදු වැසිකිළි පද්ධතිය වැඩි දියුණු කිරීමේ කර්මාන්තයට අදාළ ටෙන්ඩරය පිරිනැමීම සිදුකලේ කාටද යන්න පිළිබඳවයි.

ඒ අනුව ගරු උප සභාපතිතුමා, බලන්ගොඩ මහජන බස් නැවතුම්පළ පරිශ්‍රයේ ඇති පොදු වැසිකිළි පද්ධතිය වැඩි දියුණු කිරීමේ කර්මාන්තයට අදාළ ටෙන්ඩරය පිරිනැමීම පිළිබඳව 2025-10-03 දිනැති සභාවේ තීරණය නොකළ බවත්, එකී කර්මාන්තය ඉටුකිරීමට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ලබා දීමෙන් පසු ඒ පිළිබඳ තීරණය කළ යුතු බවත්,මේ වන විට තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ලබා ගැනීම පිණිස පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති බවත් පැවසීය.

අනතුරුව ගරු උපසභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසූ අතර ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පසුගිය 2025-10-03 දිනැති මහ සභා වාර්තාවේ පිටු අංක 03 හි බැංකියවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ අට්ටි ගැසීමේ ස්ථානය පුළුල් කිරීමේ කර්මාන්තයට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ලැබුණු පසු එම සභා වාර්තාව ස්ථිර කිරීම සුදුසු බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පැවසූයේ කර්මාන්ත පිරිනැමීම පිළිබඳ එකී සභා වලදී තීරණය නොකළ බවත්,කර්මාන්ත පිරිනැමීම පිළිබඳ තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කර කමිටුව වෙත යොමු කිරීම පමණක් සිදු වූ බවත් වාර්තාව සංශෝධනය කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බවත්

තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ලැබුණු පසු විශේෂ මහ සභාවක් කැඳවා ටෙන්ඩර් තීරණය ගත යුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා නැවතත් අදහස් දක්වමින් පැවසුයේ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා සභාවට පැමිණ නැති බැවින් ඊට අදාළ සභාව වන 2025-10-03 දිනැති විශේෂ සභා වාර්තාව සම්මත කිරීම කළ නොහැකි බවයි.එදින විශේෂ මහ සභාවේදී තීරණය කලේ තාක්ෂණික ඇගයීම් කමිටු පත් කිරීම සහ කර්මාන්ත පිරිනැමීම පිළිබඳ තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමු කිරීම බැවින් සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සම්මත කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අදාළ නොවන බව කරුණු පැහැදිලි කරමින් ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසීය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා 2025-10-03 දිනැති විශේෂ මහ සභා වාර්තාවේ සංශෝධනයක් විය යුතු බවත්, පිටු අංක 02 හි "බැංකියවත්ත කසලකළමනාකරණ මධ්‍යස්ථානය සඳහා යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා නිළධාරීන් පත් කිරීම" යන්න " බැංකියවත්ත කසලකළමනාකරණ මධ්‍යස්ථානය සඳහා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා නිළධාරීන් පත් කිරීම" ලෙසට සංශෝධනය විය යුතු බවට පැවසීය.

ඒ අනුව 2025-09-23 සහ 2025-10-03 දිනැති විශේෂ මහ සභා වාර්තා සංශෝධනයන්ට යටත්ව සත්‍ය වාර්තාවක් බවට ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී. 2025-09-23 සහ 2025-10-03 දිනැති විශේෂ මහ සභාවේ සභා වාර්තා සංශෝධනයන්ට යටත්ව ගරු සභාවේ සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

අදදින නිවේදන නොමැති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**03. සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

අදදින සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා නොමැති බව ගරුසභාපතිතුමා පවසන ලදී.

**04. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- ❖ බළන්ගොඩ නගර සභාවේ ඉන්ධන අවශ්‍යතාවය වෙනුවෙන් ඉන්ධන ලබාගත් සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතියට අයත් තුඹගොඩ ඉන්ධන පිරවුම්හලින් මුද්‍රිත බිල්පත් ලබා නොදුන් බැවින් මින් ඉහතදී ඉන්ධන ලබා ගැනීම නවතා දැමූ බවත්, නමුත් මේ වන විට මුද්‍රිත බිල්පත් ලබාදීමේ හැකියාවක් පවතින බැවින් නැවත සභාව වෙත ඉන්ධන ලබා ගැනීමේ කටයුතු සිදුකරන ලෙස දන්වමින් සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය විසින් යොමුකර ඇති ලිපිය ගරු උප සභාපතිතුමා සභාගත කරන ලදී.

- ❖ පළාත් පාලන බල ප්‍රදේශයට අදාළව ව්‍යාපාර ක්ෂේත්‍රයේ නිරත වන ව්‍යවසායකයන්ගේ සංවර්ධන කාර්යයන් සඳහා ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන බවත්,රජයේ හඳුනාගනු ලැබූ මූල්‍යායතන හරහා මෙම ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක වන අතර සරල ණය කොන්දේසි හා අඩු පොලී ප්‍රතිශතයන්ද සහන කාලයන් මත මෙම ණය නිකුත් කරනු ලබන බවත්,ආයතනයේ මහජන නියෝජිතයන් මඟින් හඳුනාගනු ලැබූ ව්‍යවසායකයින් උක්ත වැඩසටහන සඳහා සම්බන්ධ කළ හැකි බවත්,අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ නිලධාරින් මේ සඳහා පත්කර ඇති බවත් අදාළ යොමුකිරීම් සිදු කරන ලෙසත් දන්වමින් කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ රත්නපුර දිස්ත්‍රික් කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය මඟින් යොමු කර ඇති ලිපිය ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

- ❖ බළන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී බල ප්‍රදේශය තුළ ජනතාවට වඩාත් ගුණාත්මක සේවාවක් ලබා දීම වෙනුවෙන් බළන්ගොඩ නගර සභාවේ මහජන නියෝජිතයින් සමඟ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යය මණ්ඩලයේ නිලධාරීන් අතර සාකච්ඡාවක් පැවැත්වීම වෙනුවෙන් සුදුසු දිනයක් ලබා දෙන ලෙස දන්වමින් බළන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් යොමු කර ඇති ලිපිය ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් කිරිදිගල මැද පාර ජනාතාව පාර සම්බන්ධව යොමු කර ඇති ලිපිය සහ එච්.එල්.ඩබ් ආයතනයෙන් අනවසර ඉදිකිරීමක් සම්බන්ධව යොමු කර ඇති ලිපිය යන ලිපි මෙම සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම යටතේ සභාව වෙත ඉදිරිපත් කර නැත්තේ ඇයිදැයි විමසන ලදී.

ඉහත ලිපි ලියාපදිංචි තැපෑලෙන්ම සභාව වෙත යොමුකර ඇති බවත්, මෙලෙස සභාව වෙත් ඉදිරිපත් නොකරන්නේ ඇයිදැයි යන්නත් එසේනම් ලියාපදිංචි තැපැලෙන් එවන ලිපි සභාවට ලැබීමේ යම් ගැටළුවක් පවතින්නේද යන්නත් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විමසන ලදී.

එතුමා වැඩිදුරටත් සඳහන් කලේ ඉහත කිරිදිගල මැද පාර ජනතාව විසින් යොමුකර ඇති ලිපිය ලිඛිතව සභාව වෙත ගෙනවිත් භාරදී ඇති බවත්, එවැනි ලිපි ඉහත සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම යටතේ සභාව වෙත ඉදිරිපත් නොකිරීම සම්බන්ධව බරපතල ගැටළුවක් පවතින බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය පැවසූයේ එච්.එල්.ඩබ් ආයතනයෙන් යොමුකර ඇති අනවසර ඉදිකිරීම සම්බන්ධ දෙවන ලිපියත් සභාව වෙත යොමුකර ඇති බවත් ඒ පිළිබඳව ගරු සභාපතිතුමා දැනුවත් කළ අවස්ථාවේදී එම අනවසර ඉදිකිරීම පිළිබඳව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට යොමුකර ඇති බවත් නගර සභාවෙන් සිදු වූ වරදකින් එක් අයෙකුට

නඩු දැමීමට නොහැකි වී තිබෙන බැවින් සියල්ලම නොසලකා හැරීමට සිදු වන බව ගරු සභාපතිතුමා පවසා ඇති බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ තැපැල භාර නිලධාරියා ගෙන්වා ඉහත ලිපි පරීක්ෂා කිරීමට යෝජනා කරන බවත්, ආයතනයක තැපැල යනු හදවත බඳු දෙයක් බවත්, එබැවින් ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන ලිපියක් ලැබුනේ නෑ යන්න නිවරදි පිළිතුරක් නොවන බවත්,බදු ගෙවන ජනතාව සභාව වෙත ගැටළුවක් ඉදිරිපත් කර ඇති විට එයට පිළිතුරු ලබා දිය යුතු බවත්,සභාව රැස්වන්නේ මසකට එක් දිනක් පමණක් බවත්, එවිට මෙලෙස ලැබෙන ලිපි සභාවට ඉදිරිපත් නොකරන්නේ නම් එය බරපතල ගැටළුවක් බවත්ය.

පසුගියදා පැවති වැඩසටහනකදී හොඳම බදු ගෙවන්නාට හිමි සම්මානය පවා ඉහත ලිපිය ඉදිරිපත් කළ එච්.එල්.ඩබ්.ආයතනයට ලැබුණු බවත්, එවැනි පුද්ගලයෙකු යොමුකරන පැමිණිල්ලක් සඳහා සභාව අනිවාර්යෙන් පිළිතුරු ලබා දිය යුතු බවත්, ලැබුනේ නෑ දන්නෙ නෑ ආදි පිළිතුරු ලබා දීම නොව සොයාබලා නිශ්චිත පිළිතුරක් ලබා දීම සිදුකළ යුතු බවත් ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසීය.

ඉහත ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමාගේ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පැවසූයේ සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම යටතේ ඉහත පරිදි යෝජනා සම්මත කිරීම් ව්‍යවස්ථාපිතව සිදු කළ නොහැකි බවත් ගැටළු ඉදිරිපත් කිරීම කල් දී ඇති ප්‍රශ්න යටතේ ඉදිරිපත් කළ හැකි බවත්ය.

ගරු සභාපතිතුමා විසින් අදදින සභාවට ඉදිරිපත් කිරීමට තීරණය කර ලබා දී ඇත්තේ ඉහත ඉදිරිපත් කළ ලිපි පමණක් බවත්, එසේ ලිපි යොමුකර ඇත්නම් ගරු සභාපතිතුමා ඒ සම්බන්ධව අවශ්‍ය තීරණ ගනු ලබනු ඇති බවත්, සභාව වෙත ලැබෙන ලිපි සියල්ලම සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම යටතේ සභාව වෙත ඉදිරිපත් කිරීම ප්‍රායෝගිකව සිදු කළ නොහැකි බවත් ගරු උප සභාපතිතුමා කරුණු පැහැදිලි කරමින් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ එසේ තේරීම් සිදුකර සභාව වෙත ලිපි ඉදිරිපත් කරන්නේනම් සභාව වෙත භාරදී ඇති ලිපි සම්බන්ධව ලබාගත් ක්‍රියාමාර්ග පිළිබඳව ප්‍රශ්න යොමු කිරීමේදී පිළිතුරු ලබා දීම කළ යුතු බවයි.මේ අවස්ථාවේදී සභාවට තැපැල් මඟින් යොමු කරන ලිපි සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම යටතේ ඉදිරිපත් නොකිරීම සම්බන්ධව සභාවේ කෑ කෝ ගැසීමක් ඇතිවිය.

**05.ටෙන්ඩර්පත් හා මිල ගණන් විවෘත කිරීම.**

මෙදිනට නියමිත ටෙන්ඩර්පත් විවෘත කිරීම සඳහා ගරු උපසභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.

ටෙන්ඩර්පත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු උපසභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත්කරන ලදී.

අනතුරුව ටෙන්ඩර් මණ්ඩලය විසින් ගනු ලැබූ පහත සඳහන් තීරණ ගරු උපසභාපතිතුමන් විසින් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

**05.01** බලන්ගොඩ නගර සභාවට අයත් මහජන පොළ ආපනශාලාව 2025.12.01 දින සිට 2026.11.30 වන දින දක්වා බදුදීම වෙනුවෙන් සුදුසු බදුකරුවන් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් විවෘත කිරීම.

බලන්ගොඩ නගර සභාවට අයත් මහජන පොළ ආපනශාලාව වර්ෂයක කාලයක් සඳහා බදුදීම වෙනුවෙන් සුදුසු බදුකරුවන් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර්පත් කැඳවීමේදී අයදුම්පත් 04ක් නිකුත් වී තිබූ අතර පහත පරිදි ලංසු ඉදිරිපත් වී තිබූ තිබිණි.

01.කේ.කේ ජයන්ති රු.12,000.00

02.ජී.ඩබ්.නිල්මිණි රු.18,200.00

03.ජී.අමල් ප්‍රසන්න රු.25,500.00

04.ටී.ආර් මංජුලා රු.24,010.00

ඒ අනුව වැඩිම ලංසු මුදල වන රු.25,500.00 ක මුදල ඉදිරිපත් කර තිබූ ජී.අමල් ප්‍රසන්න මහතා එම ලංසු මුදල පිළිගැනීමෙන් අනතුරුව එම මහතා වෙත ටෙන්ඩරය පිරිනැමීමටත් කේ.කේ ජයන්ති මහත්මිය ඉදිරිපත් කළ ලංසුව අවම ලංසු මුදල වන රු.15,000.00ට වඩා අඩු බැවින් එම ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කර ටෙන්ඩර් ඇප මුදල සභාව සතු කිරීමටත් ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

**05:02** බලන්ගොඩ නගර සභාවට අයත් අංක 18 දරණ පොළ කඩ කාමරය 2025.10.21 දින සිට 2026.10.20 වන දින දක්වා බදුදීම සඳහා සුදුසු බදුකරුවන් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් විවෘත කිරිම.

බලන්ගොඩ නගර සභාවට අයත් අංක 18 දරණ පොළ කඩ කාමරය වර්ෂයක කාලයකට බදුදීම සඳහා සුදුසු බදුකරුවන් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර්පත් කැඳවීමේදී අයදුම්පත් 01ක් පමණක් නිකුත් වී තිබූ අතර පී.ඒ සුජීව කුමාර මහතා රු.4600.00 ක ලංසු මුදලක් ඉදිරිපත් කර තිබූ අතර අවම ලංසු මුදල වන

රු.4500.00 ට වඩා වැඩි වීම මත සහ එම මහතා ලංසු මුදල පිළිගැනීම මත එම මහතා වෙත ටෙන්ඩරය ලබා දීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

ටෙන්ඩර් මණ්ඩලය විසින් ගන්නා ලද ඉහත ටෙන්ඩර් මණ්ඩල තීරණ ගරු උපසභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කළ අතර ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**06. කල් දී ඇති ප්‍රශ්න**

**06:01 ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා**

**06:01:01** අංක 06 කාර් පාක් කඩ කාමරයේ සිදු වී ඇති වංචාව සම්බන්ධයෙන් විමර්ශණයක් සිදු කිරීමට සම්මත වූ යෝජනාව ප්‍රකාරව අදාළ ආයතන මේ වන විට දැනුවත් කර ඇත්ද?යොමු කර ඇත්නම් එම ලිපිවල පිටපත් ගරු සභාව වෙත ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

ඉහත ඉදිරිපත් කර ඇති ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු උප සභාපතිතුමා පැවසුයේ ඉන්දික පැතුම් යන අයට අයත්ව තිබූ අංක 06 කාර් පාක් කඩ කාමරය නීත්‍යානුකූල පරිදි එවකට ආණ්ඩුකාරතුමා විසින් අරුණි ප්‍රදීප් ලක්මාලි අයට පවරා දී ඇති බවත්,එහි යම් නීත්‍යානුකූල නොවන යම්කිසි අකටයුත්තක් සිදු වී ඇත්නම් ඒ බව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පෞද්ගලිකව අදාළ ආයතන දැනුවත් කර පරීක්ෂණයක් සිදු කිරීමට හැකියාව පවතින බවත්,සභාව වෙත පරීක්ෂණයක් සිදු කරන ලෙස සභාවෙන් ලිපි ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොමැති බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ පසුගිය 2025-07-08 දිනැති මහ සභාවේ මේ සම්බන්ධව යෝජනා ස්ථිරත්වයක් ලබා ගත් බවත්, තමන් ඒ සම්බන්ධව යොමු කරන ප්‍රශ්නය වන්නේ මහ සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීමේදී ගරු සභාවේ ධූරාවලිය වන ගරු සභාව ,සභාපති,මන්ත්‍රී මණ්ඩලය යන පිළිවෙළ අනුව ඊට ඉහළින් කව්රුන් හෝ සිටින්නේද යන්නත්ය.

ගරු උප සභාපතිතුමා නැවතත් පිළිතුරු ලබා දෙමින් පැවසූයේ මෙකී කඩ කාමරය අරුණි ප්‍රදීප් ලක්මාලි යන අයට අයත් වූ ආකාරය පිළිබඳව වාර්තාවක් පවතින බවත් එම ක්‍රමවේදය නීත්‍යානුකූල නොවන්නේ නම් හෝ ගැටළුවක් පවතින්නේනම් අදාළ පැමිණිලි යොමුකර පරීක්ෂණ ඉල්ලීම් පෞද්ගලිකව සිදු කළ හැකි බවයි.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා, ඉහත ප්‍රශ්නයට අදාළව "ලිපි යොමු කර ඇත්නම් එම ලිපිවල පිටපත් ගරු සභාව වෙත ඉදිරිපත් කිරීමට යෝජනා කරමි" යන්න න්‍යාය පත්‍රයේ වැරදීමකින් කල් දී ඇති ප්‍රශ්න තුළට ඇතුළත් වී ඇති බවත් නමුත් එය තමන් විසින් ඉදිරිපත් කළ යෝජනාවක් බැවින් යෝජනා තුලදී එය කතා කිරීමට අවස්ථාව ලබා දෙන ලෙසත් පවසන ලදී.

වංචාව දූෂණය පිටුදැකීමට පැමිනි රජයෙන් මෙවැනි දේ පිළිබඳව සොයා බලන ලෙස ගරු නාගරික මන්ත්‍රිනී පි.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය ප්‍රකාශ කරන ලදී. ගරු නාගරික මන්ත්‍රී

එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පැවසුයේ ඉහත ගැටළුව සම්බන්ධයෙන් ගරු සභාවේ සාකච්ඡා කළ අවස්ථාවේදී මේ සම්බන්ධව කටයුතු කිරීමට ගරු සභාපතිතුමා බැදී සිටින බවට ප්‍රකාශ කළ බවයි.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් පවසා සිටියේ 2023 අංක 09 දරණ වංචා විමර්ශන පනතින් තොරතුරක් දැනගෙන වංචාවක් සිදුවන බව දැනගෙන එය වංචා කිරීමත් පනත අනුව සිරහාරයට යා යුතු වැඩක් බවත්, මෙහි කිසි කෙනෙක් වංචාවක් සිදු කර නොමැතිනම් බියවිය යුතු නොවන බවත්, දූෂණයක් වංචාවක් සිදු වී ඇත්නම් බිය විය යුතු බවත්,පරීක්ෂණයක් ඉල්ලීම් කිරීමේදී පරීක්ෂණයක් නොකර සිටින්නේ හොරහිත නිසා බවත්ය.

මෙය ගරු සභාව බවත් ප්‍රශ්නයක් ඇසූ පමණින් ලේකම්තුමියගෙන් විමසා පිළිතුරු ලබා නොදිය යුතු බව ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් පැවසීමත් සමඟ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ සභාවට උඩින් ලේකම් නැති බවත්, මෙහි ලේකම්වරයෙකු නොමැති බවත් සිටින්නේ වැඩබලන ලේකම්වරයෙක්, පරිපාලන නිලධාරියෙකු බවත්, මෙහි සිටිය යුත්තේ පරිපාලන සේවයේ තුන්වන ශ්‍රේණියේ නිලධාරියෙකු බවත්, ගරු ලසන්ත විජේරිය මැතිතුමාට පිංසිද්ද වෙන්න කළමණාකරණ සේවයේ අධිශ්‍රේණියේ නිලධාරියෙකු මෙහි වැඩබැලීම සිදු කරන බවත්, සභාව අපහසුතාවට පත්කිරීම සිදු නොකරන ලෙසත්ය.වැඩිදුරටත් එතුමා පැවසුයේ පරිපාලන නිලධාරියාගේ සහ කළමණාකරණ සේවා නිලධාරියාගේ තත්වය කුමක්ද යන්න පළමුව තේරුම් ගත යුතු බවයි.

ඉහත අදහස් දැක්වීම පිළිබඳ කරුණු දක්වමින් ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමී මැතිතුමා පැවසුයේ රජයේ නිලධාරින් ව්‍යවස්ථානුකූලව පත්කර ඇති බවත් මෙහි ඇතිවූ කාරණාව පිළිබද ලේකම්තුමිය සම්බන්ධ කරගෙන විවාදයට නොයන ලෙසත්, එතුමිය එම පුටුවේ වාඩිවුනානම් රජයේ නීති චක්‍රලේඛන මත එතුමියගේ පැන්ෂන් එක ආරක්ෂා කරගෙන එතුමිය යා යුතු බවත්, රජයේ නිලධාරීන්ට විවිධ චක්‍රලේඛන පැවතියද දේශපාලන අධිකාරියට කිසිඳු චක්‍රලේඛනයක් නොමැති බවත්,නමුත් දේශපාලන අධිකාරිය හිතන දේ සිදු කර සමහර අවස්ථාවල හිරගෙදර යන්නේ හෝ අවසාන පිළිතුර ලබා දෙන්නේ රජයේ නිලධාරියා බවත්, ලේකම්තුමිය එතුමියගේ රාජකාරිය ඉටු කර ඇති බවත්, ඒ අනුව මේ සම්බන්ධව ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දිය යුතු බවත් ලේකම්තුමිය අසරණ නොකරන ලෙසත්,අදදින වැඩ බලන සභාපති ලෙස ගරු උප සභාපතිතුමාට මෙම ගැටළුවට පිළිතුරු ලබා දිය නොහැකි බවත්, නමුත් ගරු සභාපතිතුමා මේ සම්බන්ධව කටයුතු කරන බවට පොරොන්දු වූ බවත්, ඒ අනුව රජයේ නිලධාරියෙකු වෙත අත දික්කිරීම වැරදි බවත්, ලේකම්තුමියගේ තනතුර සුදුසුකම් ආදිය මෙහි ප්‍රශ්න නොකළ යුතු බවත්, ලේකම්තුමිය අපහසුතාවයට පත්වීම යනු නිලධාරීන්ද අපහසුතාවට පත් වීම යන්න බවත්, ඕනෑම ගැටළුවක් සාකච්ඡා කර විසඳා ගැනීම සිදු කළ හැකි බවත්, එබැවින් අනවශ්‍ය ලෙස ගැටළුවලදී රජයේ නිලධාරීන් වෙත දෝෂාරෝපණය කිරීම නොකරන ලෙස ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටින බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා නැවතත් නැඟී සිටිමින් ඉහතදී තමන් යොමුකළ අතුරු ප්‍රශ්නය වූයේ සභාවේ ධූරාවලියට උඩින් කව්රුන් හෝ නිලධාරියෙකු සිටීද යන්න බව පවසන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ අදදින මෙම ඇතිවූ ගැටළුවට සම්පූර්ණ වගකීම ගත යුත්තේ ගරු සභාපතිතුමා බවත්, මෙම ගැටළුව ඇතිවූ මුල් අවස්ථාවේදීම එතුමා ගරු සභාපති වශයෙන් නිවරදි තීන්දුව ලබා ගත්තානම් නිලධාරීන් අපහසුතාවයට පත්වීම හෝ මෙම සංවාදය සිදු නොවන බවත්, සභාවේ නිලධාරින් ආරක්ෂා කිරීම සහ නීතිය ක්‍රියාත්මක කිරීම එතුමාගේ වගකීමක් බවත්, ලේකම්තුමිය අපහසුතාවයට පත්වීම පිළිබඳ කණගාටුව ප්‍රකාශ කරන බවත්, එතුමිය දක්ෂ නිලධාරිනියක් බවත්, කොමසාරිස් පාලනය තුළදී පළාත් පාලන ආයතන කාර්යසාධන තරඟාවලියෙන් ලංකාවේ පළමු ස්ථානය පවා නගර සභාව වෙත ලබා ගැනීමට එතුමියට හැකියාව පැවති බවත් ගරු සභාපතිතුමා වගකීම පැහැර හැරීම හේතුවෙන් මෙම තත්වය උද්ගත වූ බවත්ය.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා, සභාවක මූලාසනය තුළ අසුන් ගැනීමේදී සභාවේ න්‍යාය පත්‍රය අනුව සියළුම කරුණු දැනගෙන සිටිය යුතු බවද, සෑම කාරණාවකදීම කාරක සභා බවට පත්කර කරුණු පැහැදිලි කර ගැනීමේදී නිලධාරීන් ඇතැම් විට අපහසුතාවයට පත්වන බවද, සභාපතිතුමා ලෙස ප්‍රථම වරට වැඩබලන බැවින් අදදින උප සභාපතිතුමාට චෝදනා කළ නොහැකි බවද, සභාවක් මෙහෙයවීමේදී නගර සභා ආඥා පනත පිළිබඳව පුළුල් අවබෝධයකින් යුතුව කටයුතු කළ යුතු බවද, එසේනම් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා අසනු ලැබූ ප්‍රශ්න වලට එක වචනයකින් පිළිතුරු ලබා දීමේ හැකියාව පැවති බවද පවසන ලදී.

මෙම අවස්ථාවේදී සභවේ ඇති වූ ඝෝෂාකාරී තත්වය හේතුවෙන් ගරු උප සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අනතුරුව ගරු උප සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

අනතුරුව ගරු උපසභාපතිතුමා, සභාවේදී නිලධාරීන් පිළිබඳ කතා කිරීමේදී වඩා සැලකිල්ලෙන් කතා කළ යුතු බව අවධාරනය කළ අතර, අදදින වැඩබලන සභාපති ලෙස සමහර කාරණාවලදී තීරණ ගැනීමේදී ඒවාට මැදිහත් වීමට නොහැකි බවටත් සභාව දැනුවත් කරන ලදී.

**06:02** **ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස්. චන්දන මැතිතුමා**

**06:02:01** පළාත් පාලන සතිය වෙනුවෙන් බළන්ගොඩ නගර සභාව සිදුකළ ව්‍යාපෘති සඳහා සංක්ෂිප්ත වාර්තාවක් ඉදිරිපත් කිරීම.

පළාත් පාලන සතිය වෙනුවෙන් බළන්ගොඩ නගර සභාව වැඩසටහන් 30ක් පමණ ක්‍රියාත්මක කළ අතර ඊට අදාළ වාර්තාව ලබා ගත හැක.

**06:03 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

**06:03:01** බළන්ගොඩ නගර සභාව සතු තානායමේ වර්තමාන තත්වය කුමක්ද?

බළන්ගොඩ තානායම් ගොඩනැගිල්ල ඇතුළත අළුත්වැඩියා කටයුතු මේ වන විට අවසන් කර ඇති අතර එහි මිදුල සැකසීමේ හා ලී බඩු අළුත්වැඩියා කිරීමේ කටයුතු සිදු කළ යුතුව ඇත.නමුත් මෙම තානායම් පරිශ්‍රය නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීමට නියමිත බව දැනගැනීමට ලැබීමෙන් පසු එය තහවුරු කර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත අංක බනස/ක/6/16 හා 2025.08.29 දිනැති ලිපිය යොමු කරන ලදී.

ඒ අනුව බළන්ගොඩ තානායම් පරිශ්‍රය ඇතුළු තවත් තානායම් කිහිපයක් ආමාත්‍ය මණ්ඩල තීරණයක් මත නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව නාගරික සංවර්ධන අධිකාරී අධ්‍යක්ෂකගේ අංක 29/01/31 හා 2025.09.18 දිනැති ලිපිය මඟින් දන්වා ඇත.එබැවින් එහි මිදුල සැකසීමේ හා ලී බඩු අළුත්වැඩියා කිරීමේ කටයුතු නවතා ඇත.

මෙම තානායම අළුතවැඩියාව වෙනුවෙන් ලබාගත් ණය මුදලේ ඉදිරි ගෙවීම් කටයුතු සම්බන්ධවත් මේ වෙනුවෙන් සභා අරමුදලින් දරන පිරිවැය නැවත සභාව වෙත ලබා ගැනීම සම්බන්ධවත් නාගරික සංවර්ධන අධිකාරියේ ස්ථාවරය පිළිබඳ විමසා අංක බනස/ක/3/2/30 හා 2025.10.08 දිනැතිව ලිපි යොමු කර ඇති අතර මෙතෙක් ඒ සම්බන්ධව පිළිතුරක් ලැබී නොමැත.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ තානායම බළන්ගොඩට පවතින ආභරණයක් හා ආදායම් මූලාශ්‍රයක් බවත්, රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සාකච්ඡාවේදී මේ පිළිබඳව සාකච්ඡා කිරීමට ගරු සභාපතිතුමාට හැකියාව පැවති බවත්,තානායම් පවරා ගැනීමට ආමාත්‍ය මණ්ඩල තීරණයක් ලබා ගෙන තිබුනද ආයතන 04ක් පමණ සාකච්ඡා කර නිදහස් කරගැනීම සිදු කර ඇති බවත්, පවත්නා රජය සභාපතිතුමාගේ පක්ෂයේ බැවින් අනිවාර්යෙන් මෙම තානායම පිළිබඳ ගැටළුව සාකච්ඡා කර විසඳා ගැනීමට පියවර ගන්නා ලෙසත් පවසන ලදී.

ගරු උප සභාපතිතුමා ඊට පිළිතුරු ලබා දෙමින් මෙම ගැටළුව සඳහා මැදිහත්වීමට රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා වෙත දැන්වීම් කර ඇති බවත්, සභාව වශයෙන් ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලිපි යොමු කිරීමත් සිදු කර ඇති බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත පුෂ්පකුමාර මැතිතුමා අදහස් දක්වමින් විශේෂ මහ සභාවක් හෝ කැඳවා බළන්ගොඩ තානායම සභාව වෙත රඳවා තබා ගැනීම පිළිබඳව තීරණය කළ යුතු බවත්, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.ජී වීරසිංහ මැතිතුමාගේ ධුරකාලයේදී මෙම තානායම අවුරුදු 25 ක කාලයක් සඳහා බදු වශයෙන් ලබා දී තිබූ බවත්, එම කාලය අවසානයේ නැවත රජයට භාරගැනීමට කටයුතු කිරීමේදී අදාළ දේශපාලන මැදිහත්වීම් සිදුකර නැවත සභාව වෙත ලබාගත් බවත්,එවකට ලංකාවෙන් මෙවැනි නිදහස් කර ගැනීම් 03ක් පමණක් සිදු කර ගත් බවත්, ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූ ආකාරයට මෙය බළන්ගොඩට ආභරණයක් බවත්, එබැවින් පවත්නා රජයේ මැදිහත්වීම ලබාගෙන මෙම තානායම පවරා ගැනීම වහාම නතර කරගැනීම වෙනුවෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙසත් දන්වමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී. ඒ අනුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාද විශේෂ මහ සභාවක් කැඳවා මේ පිළිබඳ සාකච්ඡා කිරීම සුදුසු බවට පවසන ලදී.

ගරු උප සභාපතිතුමා පැවසූයේ ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා පවසන පරිදිම විශේෂ මහ සභාවක් කැඳවා මේ පිළිබඳ තීරණය කිරීම සුදුසු බවයි.

**07. කල් දී ඇති යෝජනා**

**07:01 ගරු සභාපති කේ.ජී.පේමදාස මැතිතුමා**

**07:01:01** බළන්ගොඩ තානායම් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේ කර්මාන්තයට අදාළව තෙවන බිල්පත වන රු.3,258,079.07 මුදල සහා අරමුදල් වලින් ගෙවීම් කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පැවසූයේ තානායමේ අයිතිය පවා නිශ්චිත නොවන බැවින් ඉහත පරිදි බිල්පත් සඳහා ජනතාවගේ බදු මුදල් ගෙවා අපරාධ සිදු කිරීම නොකළ යුතු බවයි.

ගරු උප සභාපතිතුමා ඊට පිළිතුරු ලබා දෙමින් පවසා සිටියේ වැඩ අවසන් කර ඇති කර්මාන්ත සඳහා නොගෙවා සිටීමේ හැකියාවක් නොමැති බවයි.ගරු නාගරික මන්ත්‍රී නදීශාන් විකුමාරච්චි මැතිතුමා මෙම කර්මාන්තයට අදාළ බිල්පත ගෙවීම් කරනු ලබන්නේ සහා අරමුදල් වලින්ද එසේ නොමැතිනම් තානායම අළුත්වැඩියා කටයුතු කිරීමට දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබා ගත් ණය වලින්ද යන්න විමසන ලදී. ඒ අනුව ගරු උප සභාපතිතුමන් පැවසූයේ ඊට අදාළව තමන් දැනුවත් නොවන බැවින් ඉදිරියේදී පිළිතුරු ලබා දෙන බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:02** සභාව සතු 227-5020 ගලි බවුසරය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් තෙබුවන ගරාජ් වෙත රු.646,530.00 ක් ගෙවීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:03** සභාව සතු ZA-0228 ගිනි නිවන රථය සඳහා ආරක්ෂිත ඇඳුම් කට්ටල 02 ක් ලබා ගැනීම, 2.5" දිග හෝස් කැබලි 06 ක් මිලදී ගැනීම, SPRAY NOZZLE ලබා ගැනීම, Suction Hose කැබලි 01 ලබා ගැනීම හා අලුත්වැඩියා කිරීම වෙනුවෙන් සිතුමිණ එන්ටර්ප්‍රයිස් වෙත රු.881,500.00 ක් ගෙවීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ඉහත ගිනි නිවන රථයේ අළුත්වැඩියාවන් සභාවේ ධූරකාලය තුළ අනුමැතිය ලබා දීමෙන් සිදුකරන ලද්දක් නොවන බවත්, අළුත්වැඩියාවන් සිදු කරන ලද්දේ මිල කැඳවීම් සිදු කිරීමෙන්ද යන්නත් විමසන ලදී. අනතුරුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ ඉහත අළුත්වැඩියාව සඳහා සිතුමිණ එන්ටර්ප්‍රයියස් නමින් බිල්පතක් ඉදිරිපත් කර ඇති බවත් එහි නිල මුද්‍රාවක් නොමැති බවත්, එහි සඳහන් දුරකථන අංකය අංක 09කින් යුතු බවත්ය.

ඉහත ඉදිරිපත් කරනු ලැබූ කරුණු සම්බන්ධව වැඩ අධිකාරී මහතාගෙන් කරුණු විමසීම් කිරීම වෙනුවෙන් ගරු උපසභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.

අනතුරුව කාරක සභා අවස්ථාවේදී පිළිතුරු ලබා දීම වෙනුවෙන් නිලධාරීන් සභාවට නොපැමිණීමත් සමඟ ගරු උපසභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමී මැතිතුමා, අදදින මහ සභාව මේ වන විට අර්බුදකාරී තත්වයක පවතින බවත්,මින් ඉදිරියට සභාව කරගෙන යාමේදී සභාපතිතුමා,මන්ත්‍රී මණ්ඩලය සහ කාර්යය මණ්ඩලය එකතු වී සභාව පවත්වාගෙන යා යුතු බවත් පවසමින් යම්කිසි ගැටළුවක් සභාව තුළ උද්ගත වූ බැවින් සභාව හෙටදින වනතුරු කල් දැමීම සුදුසු බවට යෝජනා කරන ලදී.ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසූයේ හෙට දින වන තෙක් සභාව කල් දැමුවද යොදාගත් කාර්යයන් පවතින බවත්, එසේ කිරීමට අපහසු බවත්, සභාවේ ඇතිවන තත්වය පිළිබඳ

දුක්වන බවත්, පවත්නා සභාව සහ නිලධාරින් කටයුතු කරන ආකාරය සහ මීන් පෙර සභාවන් නිලධාරීන් සමඟ කටයුතු කළ ආකාරය අහසට පොළොව මෙන් හාත්පසින් වෙනස් බවත්,වචනයක් වත් කාගේ හෝ සිත රිදීමට කතා නොකර නිශ්ශබ්ධව සිටින්නේ වැඩ කරන්න, කතා කරන්න බැරි කමට නොවන බවත්, මෙවැනි සිදු වීම් හමුවේ ලේකම්තුමිය,උප සභාපතිතුමන් අඳදින අසරණ වී සිටින බවත්, සභාවේ කව්රු මොනවා කිව්වද නිලධාරින් සභාවේ සිටිය යුතු බවත්, මෙතරම් කාලයකට මෙසේ සිදු වී නොමැති බවත්,ආයතන ප්‍රධානීන් කැඳවා කරුණු විමසීම් කිරීමේදී අනිවාර්යෙන් පිළිතුරු ලබා දීමට එම නිලධාරීන් බැඳී සිටින බවත්,සභාව පැවැත්වෙන්නේ මසකට වරක් බැවින් අසනු ලබන ප්‍රශ්න වලට සභාපතිතුමා පිළිතුරු ලබා දෙන්නේත් නැත්නම් නිලධාරීන් පිළිතුරු ලබා දෙන්නෙත් නැතිනම් ඉදිරියට සභාව මෙලෙස පවත්වන්නේ කෙසේදැයි යන්නත්, ජනතාව ඡන්දය ලබා දී පත්කර ඇත්තේ සභාවට පැමිණ යම්කිසි දෙයක් කරයිකියන බලාපොරොත්තුවෙන් බවත්,මෙසේ සිදු වීමෙන් එම බලාපොරොත්තු සියල්ල සුන් වන බවත්, එය ඉතා අසාධාරණ බවත් පවසන ලදී.

එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් පවසා සිටියේ නිලධාරින් ,මන්ත්‍රී මණ්ඩලය අතර සුහදතාවය අඩු වී ඇති බවත්, අවුරුදු 28 ක් සභාව නියෝජනය කර ඇති බවත් මෙවැනි දුර්වල සභාවක් නියෝජනය කර නොමැති බවත්, මෙම සභාවේ මෙතෙක් කරපු කියපු කිසිම දෙයක් සිදු වී නොමැති බවත් ඉතාම කණගාටු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, හිටපු සභාපතිතුමා පැවසූ ආකාරයටම අඳදින ඇති වූ සිදුවීම ඉතා කණගාටු තත්වයක් බවත්, සභාව පැවැත්වෙන්නේ මසකට දිනක් බවත් එම මසට අදාළව අනුමත කරගත යුතු ගෙවීම් සහ තීරණ මෙන්ම ජනතාව ගෙන එන ගැටළු පවතින බවත්,ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වීමට සභාව සූදානම් නැතිනම් එය ගැටළුවක් බවත්, සභාවක් පැවැත්වෙන දිනට ආයතන ප්‍රධානීන් අංශ ප්‍රධානීන් ඇතුළු සියළුදෙනා සිටිය යුතු බවත්, එබැවින් සභාව කරගෙන යාමට සූදානම් වී ක්‍රමවත් සභාවක් පැවැත්වීමට කටයුතු සිදු කර ඊළඟ සභාව කැඳවීම සිදු කරන ලෙස දන්වමින් ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමී මැතිතුමාගේ යෝජනාව ස්ථිර කරන බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා පැවසුයේ සභාව කල්දමා නැවත වෙනත් දිනයක පැවැත්වීම වැරදි පූර්වාදර්ශයක් විය හැකි බවත්, සභාවේ නිලධාරින් මසකට දිනක් පැවැත්වෙන සභාව වෙනුවෙන් සූදානම්ව සිටිය යුතු බවත්, කල් තැබීම සුදුසු නොවන බවත්, අවශ්‍ය ගැටළුවලට පිළිතුරු ලබා දීමට නිලධාරීන් බැඳි සිටින බවත්, සභාව කරගෙන යාම සුදුසු බවත්ය.

මේ අවස්ථාවේ සභාව කරගෙන යාමට අවශ්‍ය අවස්ථාවන්හිදී පිළිතුරු ලබා දීමට නිලධාරීන් බැඳී සිටින බවට ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා පැවසුවද නිලධාරීන් සභාව තුළ නොමැති බව පවසමින් සභාවේ කෑ කෝ ගැසීමක් ඇතිවිය.ඒ අනුව ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා පැවසුයේ නිලධාරින්ට එසේ අත්තනෝමතිකව ක්‍රියා කිරීමට නොහැකි බවත් එසේ ක්‍රියාකරන්නේනම් නම් අවශ්‍ය පියවර ගත යුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය පැවසුයේ ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා පැවසු පරිදි නිලධාරින් අත්තනෝමතිකව ක්‍රියා කිරීම යන්න වැරදි බවත් සභාවේ ගැටළුවක් සිදු වූ බැවින් එලෙස සිදු වූ බවත්, සභාපතිතුමාට නිලධාරින් සමඟ සාකච්ඡාකර ගැටළුව විසඳිය යුතු බවත් සභාව කල් දැමීම සිදු කළ නොහැකි බවත්ය.

මේ අවස්ථාවේ ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස්.චන්දන මැතිතුමා පැවසුයේ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා නිලධාරින් පිළිබඳ ද්වේශ සහගත අදහස් දැක්වීමක් සිදුකළ බැවින් මෙලෙස සිදු වූ බවත්, එයට අවශ්‍ය කටයුතු සිදු කළ හැකි බවත්, නමුත් එයට පිළිතුර නිලධාරින් සභාවෙන් පිටවීම නොවන බවත්, නිලධාරීන් සභාව වෙත අවශ්‍ය අවස්ථාවන්හිදී අනිවාර්යෙන්ම පැමිණිය යුතු බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා, පළමුවෙන්ම අදදින සභාපතිධූරයේ වැඩබැලීම සම්බන්ධව ගරුඋප සභාපතිතුමාට ප්‍රණාමය පුදකරන බවත්, මෙම රජය පත්වුයේ වංචාව දූෂණය පිටුදැකීමට බවත්, සභාව පත් වී පළමු සභා වාරයේදීම කාර් පාර්ක් අංක 06 කඩ කාමරය පවරා දීම සම්බන්ධව වංචාවක් සිදුවී ඇති බව පැවසු බවත්, චක්‍රලේඛ ප්‍රකාරව පැවරූ ආකාරය නිවරදි නොවන බවත්, එවකට ආණ්ඩුකාරතුමාව නොමඟ යවමින් මෙය සිදු වී ඇති බවත්,ඒ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදු කරන ලෙසට යෝජනාව දැමු බවත්,එය ඒකමතිකව ස්ථිර වූ බවත්, නමුත් මාස ගණනක් ගත වුවද එම පරීක්ෂණය සිදු කරන ලෙසට අදාළ ආයතන දැනුවත් කර නොමැති බවත්, එහිදී ලබා දිය යුතු පිළිතුර පෞද්ගලිකව සිදුකරගන්න යන්න නොවන බවත්ය.

එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් පවසා සිටියේ ගිනි නිවන රථය අළුත්වැඩියා කිරීම සම්බන්ධව ඉදිරිපත් කර තිබූ බිල්පත රු.881,500 ක් බවත්, එවැනි මුදලක් මහජන බදු මුදලින් ගෙවීම් කිරීමේදී එබැවින් ප්‍රශ්න කිරීමේදී පිළිතුරු ලබා දිය නොහැකිනම් මසකට වරක්වත් පැවැත්වෙන සභාවට සහභාගී වී ඵලක් නොමැති බවත්, ගරු සභාවේ ධූරාවලිය අනුව ගරු සභාව, සභාපති, මන්ත්‍රී මණ්ඩලය සිටින බව නැවත නැවතත් ප්‍රකාශ කරන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස්.චන්දන මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම.එම්.බී බණ්ඩාර මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා යන මන්ත්‍රීතුමන්ලා පෙ.ව.11.31ටපමණ සභාවෙන් පිටවන ලදී.

ඒ අනුව සභාවේ ඇති වු අර්බුදකාරී තත්වය මත සභාවේ කටයුතු ඉදිරියට කරගෙන යාමට නොහැකි බැවින් පෙ.ව.11.33 ට පමණ ගරු උපසභාපතිතුමා විසින් සභාවේ කටයුතු අඩාලව කල් තබන ලදී.

ජේෂල නිකලන්ද,

උප සභාපති,

බළන්ගොඩ නගර සභාව